# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2317/67 - 2023 පෙබරවාරි මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2023.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(x)(ඇ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. බී. 1437 දරන ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත් ව, උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති, එයට අනුරූපීව මෙහි II වන උපලේඛනයේ II වන තීරයේ අදාළ කෙටි යෙදුම දක්වා ඇති උපාධි ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ උපාධිය ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ්හි මහනුවර, ඩී. එස්. සේනානායක මාවත, අංක 363 පිහිටි ශාඛාව (මහනුවර ශාඛාව) මෙම නියමය මගින් පිළිගනු ලැබේ : -

**I වන උපලේඛනය**

**කොන්දේසි**

1. ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් ආයතනය (මහනුවර ශාඛාව), මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලා, මහනුවර ඩී. එස්. සේනානායක මාවත, අංක 363 යන ස්ථානයේ දී පමණක් පැවැත්විය යුතු ය.

2. ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් ආයතනය (මහනුවර ශාඛාව), නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් (5) අවුරුදු ප්‍රතිසාමාලෝචනයකට යටත්ව, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලා පවත්වනු ලබන ආයතනයක් ලෙස පිළිගනු ලැබිය යුතු ය.

3. ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් ආයතනය (මහනුවර ශාඛාව) විසින්, අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිතව සම්පූර්ණ කළ යුතු (SLQF 6 වන මට්ටම) ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධියට අදාළ උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී,



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී වාණිජ්‍ය විෂය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ ("S") තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන වෙනත් සුදුසුකමක් ලබා තිබීම; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් එයට ඇඳුණු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ ("S") තුනක් (3) එකවර ලබා තිබීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

4. ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් ආයතනය (මහනුවර ශාඛාව), විසින්, අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිතව සම්පූර්ණ කළ යුතු (SLQF 6 වන මට්ටම) මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධියට අදාළ උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී,

(අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ ("S") තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන වෙනත් සුදුසුකමක් ලබා තිබීම; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් එයට ඇඳුණු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ ("S") තුනක් (3) එකවර ලබා තිබීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

## II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව | බීබීඑම් ගෞරව |
| මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) | බීඑස්සී ගෞරව ( මෘදුකාංග ඉංජිනේරුකරණය) |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2023 ජනවාරි මස 30 වැනි දින,
කොළඹ දී ය.

EOG 02 - 0005